ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி,சுஹுருபாய, ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. DRP/OP/01/DS/03(වෙළුම V )
ඔබේ අංකය / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2025.03.

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>දෙපාර්තමේන්තු එක්දින සේවය වෙත ඉල්ලුම්කරුවන් යොමු කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් DRP/OP/01/DS/03 (වෙළුම IV) හා 2022.03.10 දිනැති ලිපියට අමතර වශයෙනි.

02. එම ලිපිය මඟින්, එක්දින සේවය වෙත ඉල්ලුම්කරුවන් යොමු කිරීමේදී ඉල්ලුම්කරු ආබාධිත/අසනීප වැනි විශේෂ හේතූන් මත, ඉල්ලුම්කරුට පැමිණිය නොහැකි අවස්ථාවලදී පමණක් සමීප ඥාතිත්වය අනුව එනම්, මව/පියා/දුව/පුතා/සහෝදරයා/සහෝදරිය/ස්වාමියා/බිරිඳ යන ඥාතීන් සඳහා පමණක් නියමිත ආකෘතියට අනුවම බලය පවරා යොමු කරන ලෙසත් දන්වා ඇත.

03. එසේවුවද, ග්‍රාම නිලධාරීන් විසින් නියමිත ආකෘතිය අනුව බලය පැවරීමකින් තොරව හා ඉල්ලුම්කරුගේ සමීප ඥාතීන් නොවන අයවලුන් සඳහා බලය පැවරීම සිදු කර ජාතික හැඳුනුම්පත ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ එක්දින සේවය වෙත යොමු කරන අවස්ථා නිරීක්ෂණය වී ඇත.

04. එබැවින්, ඉල්ලුම්කරුට පැමිණිය නොහැකි ආබාධිත/අසනීප වැනි විශේෂ අවස්ථාවලදී පමණක් නියමිත ආකෘතිය අනුවම බලය පැවරීම සිදු කරන ලෙසත් ඉහත පරිදි ඥාතීත්වය තහවුරු කරගැනීමෙන් පසුව පමණක් එම බලය පැවරීමේ ලිපිය නිකුත් කරන ලෙසත් ඔබ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සියලුම ග්‍රාම නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධයෙන් ඔබ ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**එම්.එස්.පී.සූරියප්පෙරුම**

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් (වැ.බ)

පිටපත්

01. ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
02. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස
03. පු.ලි.දෙ. ප්‍රාදේශීය ඒකකයන්ට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් - කරු.දැ.ගැ.ස සහ අ.ක.ස